01

**Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities**
2015, Vol. 4 (II) 1-11pp
© The Author 2015
Ed. *Tissa Weerasekara*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# පුරාණ අනුරාධපුර නාගරික සැලැස්මේ පර්යන්තය තුළ ස්ථානගත වී ඇති පුරාවිද්‍යා ස්ථාන කළමනාකරණය සඳහා උරුම කළමනාකරණ සැලැස්මක්

එම්.ආර්. ශ්‍යාමලී ගුණරත්න[1], ඩී. තුසිත මැන්දිස්[2]

## Abstract

Many valubale Archaeological site can be seeen in the preises of the Anuradhapura old urban structure. They are closely related to Buddhism and at the present, abandond and isolated, But, there is a greate posibility for attracting both local and foreign tourists to these sites after a proper conservation and management of the above places. Only a few monuments of the Anuradhapura old city have been conserved and presented. However, they highlight the entire, pride of Anuradhapura city. The value of the old city can be highlighted once the stucture of the city is linked with the above archaeological sites. Through this research a management plan has been drafts to conserve the above places after identifying the present problums and threats. This can be implemented both in the long and short run under the heritage management plan.

Key Words: Archaeological site, Conservation and management, Monuments, Management plan

---

[1] *ප්‍රධාන පර්යේෂණ නිලධාරි, ජේතවන ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුර.*

[2] *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.* thus.mendis@gmail.com

## හැඳින්වීම

අනුරාධපුරය ලෝක උරුම නගරයක් ලෙස 1982 දී යුනෙස්කෝව අනුමතකර ඇති ලෝක උරුම නිර්ණායක වන ii, iii, vi යන නිර්නායක අනුරාධපුර පැරණි නගරයේ පවතී. එම නිර්ණායක වන්නේ,

ii. ලෝකයේ යම් සංස්කෘතික ප්‍රදේශයක් තුළ මානව අගයයන් විදහා දැක්වෙන වාස්තුවිද්‍යාත්මක තාක්‍ෂණික නාගරික සැලසුම් පිළිබිඹු කරන ස්ථානයක් වීම

iii. දැනට පවතින හෝ අභාවයට ගිය ශිෂ්ටාචාරයකට හෝ සංස්කෘතික සම්ප්‍රදායකට හිමිකම් කියන නිර්මාණයක් වීම

vi. සම්ප්‍රදායික ව පැවත එන සජීවී සම්ප්‍රදායන් හෝ සිදුවීම් අංග දැක්වෙන ස්ථානයක් වීම (UNESCO world heritage web)

මෙම උරුම නගරයේ ඇති ස්වභාවික වටපිටාව සහ එහි නටඹුන් නැරඹීමට ලක්‍ෂ සංඛ්‍යාත දෙස් විදෙස් සංචාරකයන් අඛණ්ඩ ව පැමිණේ. මෙසේ පැමිණෙන්නා වූ පිරිස් සඳහා විධිමත් කළමනාකරණ සැලැස්මක් වර්තමානය වනවිට ද ක්‍රියාත්මක නොවේ. විශේෂයෙන් ම පර්යන්තයේ උරුම ස්ථාන දිනෙන් දින විනාශමුඛය කරා ඇදෙමින් පවතී. එම නිසා අනුරාධපුර උරුම නගරයේ පර්යන්තය සඳහා උරුම කළමනාකරණ සැලැස්මක් සැකසීම කාලීන අවශ්‍යතාවයක් බව පෙනේ. මෙම පර්යේෂණය තුළින් අනුරාධපුර පර්යන්ත ප්‍රදේශයේ පවතින ශ්‍රී ලාංකීය දේශීය වාස්තුවිද්‍යාත්මක අනන්‍යතාවය හා ඉතිහාසය අර්ථදක්වමින් විදහාදක්වමින් පුරාවිද්‍යා උරුමය සුරැකීම සඳහා කළමනාකරණ සැලැස්මක් යෝජනාකර ඇත.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර ගවේෂණ තුළින් දත්ත එක්රැස් කිරීම සිදු කරන ලද අතර ශදුඅත (SWOT) සහ ස්මාර්ට් (SMART) යන විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කරමින් උරුම නගරය ආශ්‍රිත ව පවතින ශක්තීන් මෙන් ම අවකාශ හඳුනාගැනීමත්, ගැටළු හා තර්ජන විමර්ශනය කිරීමත් සිදු කරන ලදි.

## විමර්ශනය

පුරාණ අනුරාධපුර නාගරික සැලැස්මට අයත්වන පරිබාහිර භූමිය සහිත අනුරාධපුර පැරණි නගරය ලෝක උරුමයක් ලෙස නිර්දේශකර තිබීම ද උරුම නගරය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය වඩාත් තීව්‍ර වීමට ප්‍රබල හේතුවක් වී ඇත. එමෙන් ම මෙම භූමිය කළමනාකරණය කිරීම හා එය ප්‍රදර්ශනය කිරීම තුළින් ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය ලොවට විදහාපෑමට ද එය මහගු අවස්ථාවක් වන අතර ම අනෙක් අතට ශ්‍රී ලාංකික

බෞද්ධයන්ට පුරාණ බෞද්ධ නටබුන් තවදුරටත් දැකබලා ගැනීමට මෙන් ම වැඳ පුදා ගැනීමට මහඟු අවස්ථාවක් ද එ මගින් සැලසේ. තව ද අනුරාධපුරය සංචාරක ආකර්ශනීය ස්ථානයක් ලෙස තවදුරටත් විධිමත් කිරීම තුළ දැනට උපයන විදේශීය විනිමය මෙන් දෙගුණයක, තුන් ගුණයක මුදල් ඉපයීමට ද අවකාශ සැලසේ. අනුරාධපුර නගරය ඇසුරින් වන අවස්ථා පරිබාහිර ප්‍රදේශයේ පුරාවිද්‍යා ස්ථානවලට ද සමගාමීත්වයක් පෙන්වන අතර එම භූමි ද සංරක්ෂණය කර කළමනාකරණය කළ යුතු ය.

ලෝක උරුම නගරයක් ලෙස නම්කර ඇති අනුරාධපුර නගරය ආශ්‍රිත ව ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි දුර්වලතා සහ තර්ජන රාශියකි. අනුරාධපුර නගරය සඳහා ශදූඅත (SWOT) විශ්ලේෂණය ආදේශ කළ විට පොදු වශයෙන් වන දුර්වලතාවයක් ලෙස, රටේ පුරාවිද්‍යා කටයුතු හා සම්බන්ධ ව කටයුතු කරන පුරාවිද්‍යා ආයතන පුරාවිද්‍යා භූමි ආරක්ෂා කිරීම සඳහා ඉලක්කගත වැඩ සැලැස්මක් හෝ කාර්‍යක්‍ෂමතාවයක් නොදැක්වීම දැක්විය හැකි වේ. එමෙන් ම ප්‍රධාන වශයෙන් මූල්‍යමය සම්පත් උපයන පුරාවිද්‍යා කටයුතුවලට සම්බන්ධ මධ්‍යම සංස්කෘතික අරමුදල හෝ නෛතික බලය හිමි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සංචාරක ප්‍රවර්ධන කටයුතු සඳහා මැදිහත් වී ඇත්තේ සාම්ප්‍රදායික ක්‍රමවේදයන් භාවිතයට ගැනීමෙන් පමණි. ඒ තුළ වර්තමානය දක්වා ම නගරය ආශ්‍රිත ව කාර්‍යක්‍ෂම ආකාරයෙන් සංචාරක ප්‍රවර්ධන ක්‍රියාවලියක් සිදු නොවන බව කිව හැකි අතර උරුමය හා සම්බන්ධ සෙසු ආයතනවන සංචාරක මණ්ඩලය වැනි ආයතනවල තත්ත්වය ද එපරිදි ම වේ. මෙම හඳුනාගත් දුර්වලතා අතර දුටු තවත් වැදගත් කොට සැලකිය හැකි දුර්වලතාවයක් වන්නේ යටත්විජිත සමයේ සිදු කර ඇති කැණීම්, තහවුරු කිරීම්වලින් පසු ඇතැම් පුරාවිද්‍යා ස්ථාන කෙරේ වර්තමානය දක්වා ම කිසිදු මැදිහත් වීමක් සිදු නොවීම තුළ වසර 125ක් වැනි කාලයක දී ස්මාරකවල පෙර පැවති කොටස් සම්පූර්ණයෙන් ම විනාශ වී පැවතීම මෙන් ම භූමියේ පාංශු ස්තර මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වී යාම ය. ප්‍රධාන වශයෙන් පුරාවිද්‍යා භූමිවලට තර්ජන සිදුවීම මානව ක්‍රියාකාරකම් හා දේශගුණික තත්ත්වයන් මත සිදු වී ඇති බව ද හඳුනාගත හැකි විය. මෙසේ හඳුනාගන්නා ලද අනුරාධපුර පැරණි නගරය ආශ්‍රිත ව පවතින මෙම කරුණු විශ්ලේෂණයට භාජනයකර ඇත්තේ දුර්වලතා සහ තර්ජන ඒකාබද්ධකර ප්‍රධාන වශයෙන් ගැටළු වශයෙන් හඳුනාගනිමින් වන අතර අධ්‍යයනයට භාජනය කරන්නා වූ නගරයේ පරිබාහිර කලාපය තුළ ප්‍රධාන වශයෙන් පවතින ගැටළු පහත සාකච්ඡාකර ඇත.

**පරිබාහිර ව පිහිටි පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත ගැටළු හඳුනාගැනීම**

පර්යන්තය ආශ්‍රිත ව හඳුනාගත් මූලික ගැටළු මේ ආකාරයට ගොනුකර දැක්විය හැකි ය.

**ගැටළු අංක 01 .** ජනගහන වර්ධනය හා පුරාවිද්‍යා භූමි පරිභෝජනය

**ගැටළු අංක 02.** අහිතකර මානව ක්‍රියාකාරකම්

**ගැටළු අංක 03.** පාංශු ඛාදනය

**ගැටළු අංක 04.** ව්‍යුහාත්මක වෙනස් වීම්

**ගැටළු අංක 05.** සැලසුම්වල හීනත්වය

**ගැටළු අංක 06.** පුරාවිද්‍යා පර්යේෂණ පැරණි නගරයේ එක් කොටසකට පමණක් සීමා වීම

**ගැටළු අංක 07.** සංචාරක ව්‍යාපාරය විධිමත් නොකිරීම

**ගැටළු අංක 08.** විධිමත් නඩත්තු ක්‍රමයක් නොමැති වීම

**ගැටළු අංක 09.** ස්වභාවික ව්‍යසන

**ගැටළු අංක 10.** නීතිය ක්‍රියාත්මක නොවීම

**ගැටළු අංක 11.** පුරාවිද්‍යා භූමි ආරක්ෂාකර ගැනීම සඳහා පෞද්ගලික ආයතන සම්බන්ධ කර නොගැනීම

**ගැටළු අංක 12.** පුරාවිද්‍යාත්මක භූමිවල ගැබ් ව ඇති අගයයන් විනාශ වීම

උරුම කළමනාකරණ ක්‍රියාවලියේ දී සමස්ත විශ්වීය උරුමයන් සඳහා බලපාන්නා වූ ගැටළු ලෙස නව මාර්ග පද්ධති ඉදිකිරීමේ දී නීත්‍යානුකූල ව සහ නිත්‍යානුකූල නොවන ආකාරයේ ඍජු ව සහ වක්‍ර ව ස්මාරකවලට හානි සිදු වීම, පදිංචිකරුවන් සඳහා යටිතල පහසුකම් සැපයීමේ දී, කර්මාන්ත සංවර්ධන කටයුතුවල දී මෙන් ම නාගරික සහ නගර සංවර්ධනයේ දී සහ මුඩුක්කු නිසා ඉඩකඩ ඇහිරීමක් සිදුවන බව පෙන්වා දී ඇත (Sirisoma, M. H; Wijesuriya, G. 1996 : 236 - 238). වර්තමානය වනවිට පුරාණ අනුරාධපුර පර්යන්තයේ අර්ධනාගරික ප්‍රදේශයට අයත්වන පුරාවිද්‍යා භූමි ආශ්‍රිත ව පවතින අනවසර ඉදිකිරීම් කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකි ය. අනවසර ඉදිකිරීම් වර්තමාන අනුරාධපුර පැරණි නගරයේ පරිබාහිර කවයේ දැකගත හැකි වන්නේ පුරාවිද්‍යා භූමි ආශ්‍රිත ජනාවාසකරණය සහ භූමි අත්පත්කර ගැනීම් ලෙස ය. කිරිබත් වෙහෙර, බටහිරාරාමය, වෙස්සගිරිය, පන්කුලිය යන පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත ව මේ තත්ත්වය බහුල ව හඳුනාගත හැකි ය. වෙස්සගිරි භූමියේ පුරාණ සැලසුමේ නැගෙනහිර දෙසින් තිබී ඇති ප්‍රධාන ප්‍රවේශ ද්වාරය හා දානශාලාව අයත් භූමිය වර්තමානයේ ප්‍රදේශවාසීන්ට අයත් කුඹුරු ඉඩම් බවට පත් වී තිබේ. පන්කුලියේ තත්ත්වය ද එසේ ම ය. මෙහි ඇතැම් ගොඩනැගිලි ආශ්‍රිත භූමි වර්තමාන කුඹුරු වශයෙන් භාවිත කරන අතර පන්කුලිය විහාරයට අයත් පුරාණ ඉඩම් ප්‍රමාණය වූ අක්කර 20 සීමාවෙන් මේ වනවිට වැඩි ප්‍රමාණයක් ප්‍රදේශවාසීන් අත්පත්කර ගෙන සිටී. 2015 අගෝස්තු වන විට නගරයේ උතුරු දිශාවේ ඇති පුරාණ ගල්පාලම ආසන්නයේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකු විසින් සංචාරකයන් උදෙසා වෙළඳසැලක් ආරම්භකර භූමිය අත්පත් කරගෙන ඒ ආශ්‍රිත ව අනවසර නීති විරෝධී ක්‍රියා සිදු කරමින් සිටී. පර්යන්තය තුළ ස්ථානගත වී ඇති බොහෝ පුරාවිද්‍යා ස්ථාන අනුරාධපුර රාජධානියේ බිඳවැටීමත් සමග ම අභාවයට ගොස් ඇති අතර, යටත්විජිත යුගයේ දී නැවත වතාවක් යම් අවධානයකට ලක්වන නමුත් භාවිත නොවීම තුළ හිතාමතා අතහැර දැමීමක් සිදු ව ඇති බව කිව හැකි වන්නේ භෞතික ව ස්මාරක ආශ්‍රිත ව සිදුකර ඇති පර්යේෂණ මගින් වැදගත්කම හුවාදක්වා ඇති

නමුත් අවධානයක් යොමු නොවීම නිසා ය. පුරාවිද්‍යා භූමිවල වටිනාකම් පිළිබඳ ව ප්‍රදේශවාසීන් දැනුවත් නොවීම තුළ වෙස්සගිරිය, කිරිබත් වෙහෙර, බටහිරාරාමය, තොළුවිල ආදී ස්ථාන රැසක ගවයින් නිදැල්ලේ අතහැරීම හා ස්මාරකවල ගල්කණුවල ගවයින් බැඳීම නිසා එම ස්මාරක විනාශවීම ද සිදුවේ. මෙය නිමල් ද සිල්වා පෙන්වා දී ඇත්තේ ගොඩනැගිලිවල අසමමිතික පිහිටීම නිසා ගොඩනැගිලි පිළිබඳ සංවේදීතාවක් මහජනතාව නොදැක්වීම තුළ ඔවුන් එම ගොඩනැගිලි ශේෂ ඉවත්කිරීම සහ ගවයින් මුදාහැරීම තුළ ගොඩනැගිලිවල ගඩොළු ගැලවීම ගැටළුවක් ලෙස ලෙස ය (සිල්වා 2010 : 64). පුරාවිද්‍යා භූමිවල නෛතික බලය හිමි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ මධ්‍යම සංස්කෘතික අරමුදල හා සෙසු බලය හිමි රජයේ ආයතන අතර අන්‍යෝන්‍ය සබඳතා නොමැති වීම තුළ මෙම පරිබාහිර ප්‍රදේශය වෙත අවධානය අවම වී ඇත. මංමාවත් ඉදිකිරීමේ දී සහ විවිධ සංවර්ධන කාර්යයන්වල දී ස්මාරකවලට හානි කිරීම දැකගත හැකි ය. වසර සිය දහස් ගණනක් අඛණ්ඩ ලෙස පරිසරයට නිරාවරණය වී තිබීම හේතුවෙන් වර්ෂාවට ගොදුරු වීම තුළ ස්මාරක බොහොමයක් ඛාදනය වීම සිදු වී තිබේ. එ මගින් බොහෝ ස්මාරකවල කර්තෘත්වය සහ පරිපූර්ණත්ව විනාශ වී යාම සෝදාපාළුව නිසා සිදු ව ඇත. කිරිබත් වෙහෙර ස්තූපය, බටහිරාරාම ස්මාරක, වෙස්සගිරි පර්වත ඛණ්ඩ මතුපිට ස්මාරක මේ සඳහා නිදර්ශන ලෙස දැක්විය හැකි ය. ව්‍යුහාත්මක වෙනස්වීම් සඳහා බහුල ව බලපා ඇත්තේ වර්ෂා කාලයට ජලය එක් වී පැවතීම හා ගංවතුරට නිරන්තර ව ගොදුරු වීම වේ. එ මගින් පුරාවිද්‍යා භූමි ආශ්‍රිත ව දිගුකලක් ජලය එක් වී පැවතීම තුළ ස්මාරකවල ව්‍යුහයන් වෙනස්වීම සිදු වේ. මෙම තත්ත්වය පර්යන්තයේ පිහිටන බටහිරාරාම, පන්කුලිය, වෙස්සගිරිය තුළින් හඳුනාගත හැකි ය. මෙම ගැටළුව පුරාණ අනුරාධපුර නගරයට ම පොදු ගැටළුවක් බවට වර්තමානයේ පත් ව ඇත්තේ වාර්ෂික ව ගංවතුර තත්ත්වයන්ට භාජනය වීම තුළිනි. පර්යන්තයේ උරුම ස්ථාන ආරක්ෂා කිරීම සඳහා උරුම කළමනාකරණ සැලසුම් නොමැති වීම තුළ ඒ සඳහා අවධානය ද ඉතාම අවමවීම, උරුමය ආරක්ෂා කිරීමේ වැඩ සැලැස්ම තුළ පරිබාහිර කලාපයේ ස්ථානගත වී ඇති පුරාවිද්‍යා භූමි ඇතුළත් නොවීම, පුරාවිද්‍යා පර්යේෂණ සඳහා පර්යන්තයේ භූමි තෝරා නොගැනීම, සංචාරක කටයුතු කළමනාකරණය නොවීම තුළ සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් නොමැති වීම, ඊසාන දිග මෝසමෙන් අනුරාධපුර නගරයට නොවැම්බර්, දෙසැම්බර් මාසවල ඇතිවන අධික වර්ෂාවෙන් ඇතිවන ගංවතුර තත්ත්වය නිසා පූජා නගරයට පිවිසෙන මාර්ග එනම්, මල්වතුඔය පටුමග, සිංහකණුව අසල මාර්ග, ශ්‍රී මහාබෝධිය මාවත, ශ්‍රී මහාබෝධි මාවතේ දකුණට ඇති ජේතවනාරාම මාවත, භයාගිරි හන්දිය, ඇතුළු පිවිසුම් මාර්ග ජලයෙන් යටවීම නිසා සංචාරකයින්ට නගරයට ඇතුලුවීමට නොහැකි වීම සහ එම නිසාවෙන් විශාල විදේශ විනිමය ප්‍රමාණයන් උපයාගත නොහැකි වීම, පර්යන්තයේ පවතින දේපලවල සැලසුම්, මාර්ගෝපදේශක හා ව්‍යවස්ථා පාලනය දුර්වල වී ඇති බව මීට පෙර සිදු කරන ලද සැලසුම්වල දී ද හඳුනාගෙන ඇත.

සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයේ දී පර්යන්තය සම්පූර්ණයෙන් ම අමතකකර තිබීම, අනුරාධපුර නගරයට පැමිණෙන සංචාරකයන් රඳවාගැනීමට අපොහොසත් වීම, අනුරාධපුරයට ඇතුල්වන ඇතැම් ප්‍රවේශ මාර්ග වර්ෂා සමයට ජලයෙන් යටවීම නිසා සංචාරකයන් අපහසුතාවයන්ට පත්වීම ආදිය ද සංචාරක ව්‍යාපාරය විධිමත් නොකිරීමේ ගැටළුවට අයත් වේ. පර්යන්තයේ පවතින පබ්බතාරාම හා පධානඝර මෙන් ම සෙසු ස්මාරකවල ආයුකාලය වර්ධනය කිරීමේ සහ එහි පවතින කැපීපෙනෙන විශ්වීය අගයයන් ආරක්ෂා

කිරීම සඳහා විධිමත් නඩත්තු කිරිමක් වර්තමානය වනවිට ද ක්‍රියාත්මක නොවීම ද ගැටළුවක් ලෙස හඳුනාගන්නා ලදි. එමෙන් ම පුරාවිද්‍යා ආඥා පනතේ නීති පද්ධතිය නිසි ආකාර ව ක්‍රියාත්මක නොවීම ප්‍රධානතම ගැටළුවකි.

අනුරාධපුර උරුම නගරය පරිබාහිර කලාපය ආශ්‍රිත ව ඇති ස්මාරකවල ස්වභාවය හා අවශ්‍යතාවය පදනම්කර ගනිමින් යෝජිත කළමනාකරණ සැලැස්මේ අභිමතාර්ථ ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් යටතේ ඉදිරිපත්කර ඇත.

1. කෙටි කාලීන අවශ්‍යතා හා අභිමතාර්ථ

2. දීර්ඝ කාලීන අභිමතාර්ථ

කෙටිකාලීන අරමුණු යටතේ අනුරාධපුර පුරාණ නගරයේ පරිබාහිර අර්ධ නාගරික ප්‍රදේශයේ උරුමය ප්‍රවර්ධනය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත උරුම කළමනාකරණ සැලසුමේ දී කාලීන අවශ්‍යතාවය අනුව සිදු කිරීමට අවශ්‍යවන කාර්යයන් හඳුනාගන්නා ලදි. පුරාවිද්‍යා භූමිවල වැදගත්කම හා ස්මාරකවල වැදගත්කම පිළිබඳ ව කෙටි විස්තරයක් ඇතුළත් වන පරිදි වර්ණ ඡායාරූප සහිත ව සැකසූ අත්පත්‍රිකා බෙදාහැරීම. ප්‍රදේශයේ ආගමික නායකයින්, ග්‍රාම නිලධාරීන්, ගුරු භවතුන්, පාසල් සිසුන් සම්බන්ධකර ගනිමින් පුරාවිද්‍යා කාර්යයන්ට අදාළ ව මධ්‍යම සංස්කෘතික අරමුදල සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි ආයතනවල නිලධාරීන්ගේ මැදිහත් වීමෙන් මෙම වැඩමුළු පැවැත්වීම සුදුසු වේ. ජංගම සහ කෙටි ප්‍රදර්ශන ද පුරාවිද්‍යා නිලධාරීන්ගේ දායකත්වයෙන් පැවැත්වීම මේ සඳහා ඇති තවත් විකල්පයක් වේ. විවිධ ආයතනවල උගතුන්, විද්වතුන්, විද්‍යාර්ථයින් සහභාගි කරවා ගනිමින් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය දෙක ම භාවිත කොට ඉදිරිපත් කිරීම් මගින් සම්මන්ත්‍රණ පැවැත්වීම සුදුසු වේ. ඉහත දක්වන ලද පිරිස් සම්බන්ධකර ගනිමින් වැඩි වශයෙන් අත්හැර දැමීමට පත් ව ඇති වටිනා ස්මාරක අවම වශයෙන් වසරකට දෙ වතාවක් ශ්‍රමදාන වැඩසටහන් පැවැත්වීම මගින් එළි පෙහෙළි කර ගැනීම සුදුසු වේ. ස්මාරක භූමිවල අනවසර පදිංචිකරුවන් පදිංචි වීම වැළැක්වීම සඳහා නෛතික බලය තහවුරුකර ගැනීමට පුවරු ප්‍රදර්ශනය කළ හැකි ය.

**යෝජිත දීර්ඝකාලීන අරමුණු පහත සඳහක් පරිදි යෝජනා කළ හැකි ය.**

හුදකලා වී ඇති වටිනා පුරාවිද්‍යා ස්ථානවල හුදකලාභාවය අවමකර අත්‍යාවශ්‍ය ස්මාරක සංරක්ෂණයකර එම ස්ථාන සජීවිකරණය කිරීම, පුරාණ අනුරාධපුර රාජධානියේ අතීත ශ්‍රී විභූතිය පිළිබිඹු කරන වටිනා ස්මාරකවල නටබුන් ආරක්ෂා කිරීම, අතීත ශ්‍රී ලංකාවේ සමෘද්ධිමත්භාවය විදහාදක්වන දේශීය වාස්තුවිද්‍යා ප්‍රතිභාව දැකගැනීමට සැලැස්වීම, අනුරාධපුර මධ්‍ය ප්‍රදේශයේ සංචාරක ප්‍රවර්ධනය තවදුරටත් වර්ධනය කිරීම, පර්යන්තයේ පිහිටි වටිනා ආකර්ශනීය පුරාවිද්‍යා ස්ථාන සංචාරක ටිකට්පතට ඇතුළත්කර ආර්ථිකමය වාසි වර්ධනයකර ගැනීම, අනුරාධපුර ලෝක උරුමය තුළින් අතීත ශ්‍රී ලංකාවේ ස්වර්ණමය ප්‍රෞඪ ඉතිහාසය අභිමානය විදහාදැක්වීම තුළින් සංචාරක ප්‍රවර්ධන පහසුකම් උපරිමයට ළඟා කරදීම සිදු කළ හැකි වනු ඇත.

අනුරාධපුර පුරාණ නාගරික සැළැස්මේ පර්යන්තය සහ සෙසු කලාප කළමනාකරණයේ දී හඳුනාගත් දුර්වලතා සහ තර්ජන ශදුඅත (SWOT)

විශ්ලේෂණය තුළින් හඳුනාගෙන එහි පවතින දුර්වලතා සහ තර්ජන අවමකර ගැනීමේ මූලික අභිප්‍රායයන් සහිත ව පහත යෝජනා ඉදිරිපත් කරනු ලැබේ. එමෙන් ම වර්තමානය වනවිට අනුරාධපුර නගරය ආශ්‍රිත පවතින යථෝක්ත ව හඳුනාගන්නා ලද සංචාරක ව්‍යාපාරයේ ශක්තීන් වර්ධනයකර ගැනීම සඳහා ද යෝජනා ඉදිරිපත්කර ඇත.

- i. අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම
- ii. අහිතකර මානව ක්‍රියාකාරකම් අවමකිරීම
- iii. පාංශු ඛාදනය සඳහා පිළියම් කිරීම
- iv. ව්‍යුහාත්මක වෙනස් වීම් අවම කිරීම
- v. සැලසුම්වල හීනත්වය මඟහරවා ගැනීම
- vi. යෝජිත පර්යේෂණ ස්ථානයන් සඳහා පර්යේෂණ හඳුනාගැනීම හා පර්යේෂණ සිදුකිරීම
- vii. සංචාරක ව්‍යාපාරය විධිමත් කිරීම
- vii.i යෝජිත සංරක්ෂණ භූමි සහ පුරාවිද්‍යා ස්මාරක හඳුනාගැනීම
- vii.ii යෝජිත පුරාවිද්‍යා භූමි ඉදිරිපත් කිරීම් ක්‍රමවේදයන් හඳුනාගැනීම
- vii.iii යෝජිත ප්‍රවර්ධන කාර්යයන් හඳුනාගැනීම
- viii. විධිමත් නඩත්තු ක්‍රමයක් සැකසීම
- ix. ස්වභාවික ව්‍යසන මගින්වන හානිය අවමකර ගැනීම
- x. නීති පද්ධතිය කාර්යක්ෂම කිරීම සහ සංශෝධනය කිරීම
- xi. වෙනත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන සම්බන්ධ කරගැනීම (ගුණරත්න 2016:195-294).

මෙම දුර්වලතා සහ තර්ජන හඳුනාගනිමින් අනුරාධපුර පුරාණ නගරයේ පරිබාහිර ප්‍රදේශය මූලිකකර ගනිමින් අනුරාධපුර සෙසු කලාපයන් කෙරෙහි ද යම් දායකත්වයක් ලබාදීම අරමුණුකර ගනිමින් විධිමත් කළමනාකරණ ක්‍රියාදාමයක් සැකසීම සඳහා ස්මාර්ට් (SMART) විශ්ලේෂණ ක්‍රමය ද යොදාගෙන ඇත. එම න්‍යාය පර්යේෂණ කාර්යයන් සඳහා ආදේශනය පහත සඳහන් පරිදි සිදුකරන ලදි.

අනුරාධපුර පරිබාහිර ප්‍රදේශයේ ඉහත සඳහන්කරන ලද ස්ථාන ආශ්‍රිත ව දැනට ජනාවාස වී ඇති ස්ථානයන්හි පවතින ස්ථාන විනාශ වී යාම අවමකිරීම සඳහා ක්‍රියාකිරීමට පහත යෝජනා ඉදිරිපත් කෙරේ.

1. ගැසට් නිවේදනයක් මගින් ඉවත් කිරීමට යෝජිත පවුල් ප්‍රමාණය සඳහා නිවේදන නිකුත්කර ඇති කාලවකවානු සොයා බැලීම සහ හඳුනාගැනීම.
2. නව ඉදි කිරීම් නැවැත්වීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් බලය පාවිච්චිකර නීතිමය පියවර ගැනීම
3. භූමියේ වෙසෙන පදිංචිකරුවන්ට භූමියේ වටිනාකම පිළිබඳ පණිවිඩය ක්‍රම කිහිපයක් ඔස්සේ ලබාදීම
4. රැස්වීම් මගින් දැනුවත් කිරීම
5. අත් පත්‍රිකා බෙදාහැරීම
6. කුඩා ග්‍රන්ථයක් සකස්කිරීම
7. රූපවාහිනී මාධ්‍ය ඔස්සේ වෙන ම වැඩසටහන් තුළින් රූපරාමු සහිත කථිකාවතක් ඇතිකිරීම

8. පුවත්පත් මාර්ගයෙන් ශාස්ත්‍රීය ලිපි ඔස්සේ භූමියේ වටිනාකම පිළිබඳ ප්‍රකාශන පළකිරීම
9. පාර්ශ්වකරුවන් සමඟ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, නගර සභාව, අටමස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේලා, වෙනත් විහාරස්ථාන, ග්‍රාම නිලධාරීන්, නගර නිර්මාණ දෙපාර්තමේන්තුව, උතුරු මැද පොලිස් දෙපාර්තමේන්තුව ආදී ආයතන සමග ඒකාබද්ධ ව සුහද හමුවක් පවත්වා ඒ තුළින් පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම්වලට සවන්දීම හා ඒ ඇසුරෙන් අවශ්‍ය සංවර්ධන කාර්යයන්, ඉදිකිරීම්, ඉවත්කිරීම්, ආරක්ෂා කිරීම් සහ වෙනත් කටයුතු සිදු කිරීම
10. භූමියේ වටිනාකම නිසා සියලු ම ඉදිකිරීම් ඉවත්කර භූමිය ලෝක උරුම භූමියක් ලෙස දෙස් විදෙස් සංචාරකයන් සඳහා ඉදිරිපත් කිරීම
11. නව ගැසට් නිවේදනයක් මගින් ගරු අමාත්‍යවරයා විසින් නැවත අවසාන ගැසට් නිවේදනය නිකුත් කිරීම
12. ජාතික මෙහෙවරක් වශයෙන් සලකා මෙය සිදු කිරීම හා ඒ වෙනුවට පදිංචිකරුවන්ට වෙන්කර ඇති ස්ථාන හඳුනාගැනීමෙන් පසු එම ස්ථානවල පදිංචි වීමට අකමැති නම් ඉවත්වීම වෙනුවෙන් ගෙවන වන්දි මුදල ඉහළ නැංවීම
13. මෑත කාලීන ව සිදු කරන අනවසර ඉදි කිරීම් වහා ම නැවැත්වීමට කටයුතු කිරීම

අහිතකර මානව ක්‍රියාකාරකම් අවම කිරීම සඳහා පුරාවිද්‍යා ආඥා පනතේ සම්පාදිත නීති දැඩි ව ක්‍රියාත්මක කිරීම, ස්මාරක භූමි ප්‍රදේශවාසීන්ට රැකබලා ගැනීමට අවස්ථා සැලසීම සහ ප්‍රදේශයේ විහාරස්ථානය, පාසල වැනි ආයතන සම්බන්ධකර ගැනීම මෙන් ම උරුමය සුරැකීම ග්‍රාම නිලධාරීගේ වගකීමක් බවට පත්කිරීම, පාංශු ඛාදනය වැළැක්විම සඳහා යටත්විජිත යුගයේ කැණීම්කර භූමි සංරක්ෂණය නොකිරීමේ හේතුවෙන් ගංවතුර තත්ත්ව සහ ජලය එක්රැස් වීම හේතුවෙන් ව්‍යුහාත්මක වෙනස් වීම් සිදු ව ඇති ස්ථාන ඉක්මණින් සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙලක් සැකසීම සුදුසු වේ. සැලසුම්වල හීනත්වය මගහරවා ගැනීම පර්යන්ත ප්‍රදේශයට සුවිශේෂී අවධානයක් යොමුකර පැරණි නගරයේ සෙසු කලාප කෙරෙහි ද සැලකිල්ලක් දක්වමින් කළමනාකරණ සැළැස්මක අත්‍යවශ්‍ය සැලසුම්වන යෝජිත සංරක්ෂණ සැලැස්ම, යෝජිත නඩත්තු සැලැස්ම, යෝජිත සංචාරක ප්‍රවර්ධන සැලැස්ම සහ යෝජිත මානව සම්පත් කළමනාකරණ සැලසුම් සැකසීම, මෙන් ම පරිබාහිර ප්‍රදේශයේ පිහිටි පුරාවිද්‍යා භූමිවල ඇති ජෛව විවිධත්ව ලක්ෂණයන්, සංස්කෘතික ලක්ෂණ භෞතික ව දැකගත හැකි භූ දර්ශණයේ පරිණාමීය සඳහා බලපාන්නා වූ මානව සහ ස්වභාවික සංසිද්ධි වාර්තාකරණය කිරීම අනුරාධපුර නගරයේ මේ වනවිට සිදු කර ඇති පර්යේෂණ ඇසුරින් හමු වී ඇති දත්ත අනුසාරයෙන් භූ දර්ශණයේ තිරස්මානය විමර්ශනය කිරීම සඳහා පරිබාහිර කලාපයේ තෝරාගත් පුරාවිද්‍යා ස්ථාන ඇසුරින් පර්යේෂණ කැණීම් සිදුකර තාක්ෂණික - සංස්කෘතික අවධිවල පෙළ ගැස්ම හඳුනාගැනීම සඳහා සිරස් පර්යේෂණ කැණීම් සිදුකිරීම යෝජනා කෙරේ. තව ද එක් එක් පුරාවිද්‍යා භූමිවල අවශ්‍යතාවය අනුව සහ උපයෝගීතාවය මෙන් ම වටිනාකම ආදිය අනුව විධිමත් නඩත්තු ක්‍රමවේදයන් සැකසීම ද යෝජනා කෙරේ. පැරණි නගරයට ප්‍රවේශවන ස්ථාන හා පුරාවිද්‍යා භූමි මෙන් ම නගරයේ ජලයෙන් යටවන මාර්ග පද්ධති ආශ්‍රිත ස්ථාන ජලයෙන් යටවීම වැළැක්වීමට රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ ඒකාබද්ධ ව පියවර

ගැනීම අවශ්‍යතාවය අනුව නව නීති සංශෝධනය කිරීම් ද සිදුකිරීම වැදගත් වේ. මෙහි දී  දඬුවම් ක්‍රම සංශෝධනය සහ දඩ මුදල වැඩි කිරීම මගින් යම් දුරකට මෙම තත්ත්වය මඟහරවාගත හැකිවනු ඇත. වර්තමානය වනවිට ප්‍රසිද්ධිය වෙනුවෙන් මූල්‍යාධාර සැපයීමට බැංකු, පාසැල් වැනි ආයතන ඉදිරිපත් වේ. එම නිසා පසුවිපරම් අධීක්ෂණ වැඩ පිළිවෙලක් යටතේ පුරාවිද්‍යා භූමි නඩත්තුව සහ ප්‍රතිසංස්කරණ සඳහා මූල්‍යාධාර ලබාගැනීම සඳහා යෝජනාවලි සකස්කර එ වැනි ආයතන මේ ක්‍රියාවලිය සඳහා සම්බන්ධකර ගැනීම යෝජනා කෙරේ.



වර්ෂාකාලවල ජලයෙන් යටවන වෙස්සගිරි ගොඩනැගිලි



නීති විරෝධි ක්‍රියා සිදුවන වෙස්සගිරි භූමිය



කිරිබත් වෙහෙර පොකුණක් තුළ අනවසර ඉදිකිරීම් සහිත ජනාවාසය



පන්කුලිය භූමියේ අනවසර වගා කටයුතු




පර්යන්තයේ ඇති අක්‍රමවත් පුවරු



බටහිරාරාමයේ සිදු ව ඇති ව්‍යුහාත්මක වෙනස්කම්

**ආශ්‍රිත ග්‍රන්ථ**

Sirisoma, M. H, G.Wijesuriya., 1996. Planning for land use at National Level Conservation Issues 231-238, ***Monuments and Sites Sri lanka,*** Central Cultural Fund, ICOMOS.

Silva, N., 2010 ***Management plan,*** Central cultural fund, Colombo.

Unesco World heritage web,***World Heritage Town of Sukothai*** ,2007:40-44

ගුණරත්න එස්., 2016, ***අනුරාධපුර පර්යන්තයේ පිහිටන පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය හා ඉදිරිපත් කිරීම සඳහා යොජනාවලියල*** දර්ශන විශාරද උපාධි නිබන්ධනය, අප්‍රකාශිතය.